පරිච්ඡේදය

# කොටස් ගණුදෙණු බද්ද

**ඉගෙනුම් ඵල:**

| දැනුම් සංරචකයන් | ඉගෙනුම් ඵලය |
|---|---|
| **6.2.** කොටස් ගණුදෙනු බද්ද | **6.2.1.** කොටස් ගණුදෙනු බද්ද අදාල කිරීම සහ බද්ද පැනවීම පැහැදිලි කරන්න<br>**6.2.2.** බදු එකතු කිරීම සහ ගෙවීම පැහැදිලි කරන්න.<br>**6.2.3.** වාර්තා ඉදිරිපත් කිරීම පැහැදිලි කරන්න.<br>**6.2.4.** බද්ද අය කරගැනීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන්න. |

JMC vLearning
"your virtual learning partner"

**1.බද්ද පැනවීම.**

2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සහ ඉන්පසු එළැඹෙන සෑම වර්ෂයක් සඳහාම කොටස් වෙළඳපළ මගින් පවත්වාගෙන යනු ලබන සෑම කොටස් වෙළඳාම් ගනුදෙණුවකටම පිරිවැටුම මත සෑම මිලදීගන්නකුගෙන් සහ විකුණුම්කරුවකුගෙන්ම කොටස් ගණුදෙණු බද්ද නම් වූ බද්දක් 2005 අංක 5 දරන සංශෝධිත මුදල් පනත මගින් පනවන ලදී.

**කොටස් ගණුදෙනු බද්ද අයකරනු ලබන බදු අනුපාත.**

| | | |
|---|---|---|
| 2005 ජනවාරි 1 දින සිට 2011 ජනවාරි මස 1 දිනට පෙර | - | පිරිවැටුම මත 0.2% |
| 2011 ජනවාරි 1 දින සිට නමුත් 2016 ජනවාරි 1 වන දිනට පෙර | - | පිරිවැටුම මත 0.3% |
| 2016 අප්‍රේල් මස 1 දිනට පසු එළඹෙන කාල වකවානු සඳහා | - | පිරිවැටුම මත 0.3% |

කොටස් ගණුදෙණු බද්ද 2016 ජනවාරි මස 1 වන දින සිට අයකිරීම ඉවත් කර 2016 අප්‍රේල් මස 1 වන දින සිට 0.3 ක අනුපාතයකින් නැවත පනවන ලදී.

**2. කොටස් ගණුදෙනු බද්ද එකතු කිරීම(8 වගන්තිය)**

එසේ පනවා ඇති බද්ද එම කොටස් ගණුදෙනු පියවීම සඳහා වගකිව යුතු අදාළ කොටස් තැරැව්කරු, කොටස් වෙළෙන්දා හෝ භාරකාර බැංකුව විසින් එකතු කරනු ලබන අතර, ඉන්පසු එය කොටස් ගණුදෙනුව සිදු වූ කොටස් වෙළඳපළට ගෙවනු ලැබේ.

**3.බදු ගෙවීම (8 වගන්තිය)**

කොටස් තැරැව්කරු , කොටස් වෙළෙන්දා හෝ භාරකාර බැංකුව විසින් සිදුකරන ලද පියවීම් දින සිට වැඩ කරන දින තුනක් ඇතුළත කොටස් වෙළඳපල විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතුය.

**4.වාර්තා ඉදිරිපත් කිරීම(9 වගන්තිය)**

සෑම මසකම අවසාන දින සිට දින පහළොවක් ඇතුළත කොටස් ගනුදෙනු බද්ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබ ඇත්තේ සම්පූර්ණ පිරිවැටුමක් සම්බන්ධයෙන් ද එම සම්පූර්ණ පිරිවැටුම පෙන්නුම් කරන මාසික ප්‍රකාශයක් කොටස් වෙළඳපල විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

JMC vLearning "your virtual learning partner"

**5.බද්ද ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක ගත යුතු ක්‍රියාමාර්ග (10 වගන්තිය)**

නියමිත දිනට කොටස් හුවමාරුවට එකතු කරන ලද මුළු බදු මුදල ප්‍රේෂණය කිරීමට අපොහොසත් වන ඕනෑම කොටස් තැරැව්කරුවකු, කොටස් වෙළෙන්දෙකු හෝ භාරකරුවකු පැහැර හරන අයකු ලෙස සලකනු ලැබේ. මෙම පැහැර හරින්නා සමාගමක නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළුව අනෙක් සෑම අධ්‍යක්ෂවරයෙක්ම හෝ ප්‍රධාන නිලධාරියෙකුම වේ.

පැහැර හරින ලද බද්දට අමතරව අධිභාරයක් ගෙවීමට බදු පැහැර හරින තැනැත්තා බැඳී සිටී. අධිභාරය ගණනය කරනුයේ බද්ද ගෙවිය යුතු දින පටන් මාසයක කාලයක් හෝ ඉන් යම් කොටසක් දක්වා කාලය වෙනුවෙන් අය විය යුතු පැහැර හරින ලද බදු මුදලින් 10% ක් සහ ඊට පසු, පසුවන සෑම මසකටම හෝ ඉන් යම් කොටසක් සඳහා පැහැර හරින ලද බද්දෙන් 2% ක බැගින් ය.

මෙසේ ගණන් බලනු ලබන අධිභාරය කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබේ. කොමසාරිස් ජනරාල්වරයා විසින් මාස තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පැහැර හරින ලද බදු සහ ඊට අදාළ අධිභාරය අය කර ගැනීම සඳහා පියවර ගනු ඇත.

මෙසේ පියවර ගැනීමට සති තුනකට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් පැහැර හැර ඇති කොටස් ගනුදෙනු බදු මුදල සහ ඒ මත එකතු වූ අධිභාර මුදල අය කර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව දන්වා බදු පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කළ යුතුය.

එම දැන්වීමේ ඇති සති තුනක කාල පරිච්ඡේදය ඉකුත් වූ පසුවද, අධිභාරය සමග පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබෙන අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නාවූ හෝ ව්‍යාපාරය කරගෙන යන්නාවූ හෝ කොට්ඨාශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහේස්ත්‍රාත්වරයා වෙත පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් කළ සහතිකයක්, ඔහු බදු පැහැර හරින ලද බවට ප්‍රකාශයක් සමග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

එම සහතිකය ලැබුනු විට නියම කරන දිනෙක තමා ඉදිරියේ පෙනී සිට, පැහැර හරින ලද කොටස් ගණුදෙණු බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාරය ද අයකරගැනීම සඳහා තමාට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොගත යුත්තේ මන්දැයි, හේතු සාධක ඉදිරිපත් කරන ලෙසට මහේස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබේ. එසේ දක්වන ලද හේතු සාධක ප්‍රමාණවත් නොවේ යයි මහේස්ත්‍රාත්වරයාට පෙනේ නම්, පැහැර හරින ලද කොටස් ගණුදෙණු බද්ද සහ ඒ මත එකතු වූ අධිභාරය මහේස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් ලෙස සලකා බදු පැහැර හරින්නාගෙන් අයකර ගැනීමට ඔහු ආඥා කරනු ලැබේ. එසේ අයකරනු ලබන මුදල් කොමසාරිස් ජෙනරාල්වරයා වෙත ප්‍රේෂණය කර ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

### 6. කොටස් තැරැව්කරු, කොටස් වෙළෙන්දා හා භාරකාර බැංකුව

කොටස් තැරැව්කරු - මින් අදහස් වන්නේ, කොමිස් මුදලක් සඳහා ආයෝජකයින් වෙනුවෙන් සුරැකුම් පත් මිලදී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක යෙදී සිටින යම් පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් වේ.

කොටස් වෙළෙන්දා - මින් අදහස් වන්නේ සුරැකුම් පත් මිලදී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ නැතහොත් සුරැකුම් පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හෝ වෙළදාම් කිරීමේ නියැලී සිටින හෝ සුරැකුම් පත් රක්ෂණය කිරීමේ හෝ තබා ගැනීමේ යෙදී සිටින යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත මණ්ඩලයක් වේ.

භාරකාර බැංකුව - මින් අදහස් වන්නේ, කොටස් ගණුදෙනු සම්බන්ධයෙන් භාරකාර සේවා සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දී ඇති යම් බැංකුවකටය.

JMC vLearning
"your virtual learning partner"

පරිච්ඡේද සාරාංශය

**පරිච්ඡේද සාරාංශය**

කොටස් ගණුදෙණු බද්ද, කොටස් වෙළඳපල හරහා සිදු කෙරෙන සෑම කොටස් වෙළඳ ගණුදෙනුවකින්ම පැන නගින පිරිවැටුම මත ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් විසින් ගෙවිය යුතුය.

කොටස් වෙළඳපල මගින් එසේ ගැනුම්කරුවගෙන් හා විකුණුම්කරුවන්ගෙන් එකතු කරගන්නා බද්ද, කොමසාරිස් ජෙනරාල් වරයා වෙත ප්‍රේෂණය කල යුතුය.

කොමසාරිස් ජෙනරාල් වරයාට, මහේස්ත්‍රාත් වරයකු හරහා, බදු ගෙවීම පැහැර හරින ලද තැනැත්තාට එරෙහිව, අයකරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට බලය ඇත.

JMC vLearning
"your virtual learning partner"

**ප්‍රගති පරීක්ෂණය**

1. කොටස් ගණුදෙණු බද්ද පැනවීම, ගෙවීම සහ අයකරගැනීම පාලනය කරන ප්‍රඥප්තිය කුමක්ද?
2. පිරිවැටුම මත වර්තමාන කොටස් ගණුදෙණු බද්ද ආරෝපණ අනුපාතය කොපමණද?
3. පැහැර හරින බදු සඳහා, බදු පැහැරහරින්නන් මත පනවන දණ්ඩණ අනුපාතය කුමක්ද?

JMC vLearning
"your virtual learning partner"

1. 2005 අංක 5 දරන සංශෝධිත මුදල් පනත

2. පිරිවැටුම මත 0.3% අනුපාතයක්

3. බද්ද ගෙවිය යුතු දින පටන් එක් මාසයක් පසු වීමට තෙක් කාලය හෝ ඉන් යම් කොටසක් දක්වා කාලය වෙනුවෙන් අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් 10% හා ඊට පසු වන සෑම මසකටම හෝ ඉන් යම් කොටසක් සදහා පැහැර හරින ලද බද්දෙන් 2% බැගින්ය.

JMC vLearning
"your virtual learning partner"